**ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 310 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (ආ) | ගබඩා අත්තිකාරම් ගිණුමේ නිකුත් කළ තොගයේ පිරිවැය ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව නිවැරදිව ගණනය කළ යුතුය. | 1.6.1 (ඇ) (ii) |

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසැඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනයේ ACA -5 ආකෘතියෙහි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ මුදලින් අත්තිකාරම් ලැබීම රු. 39,800 ක් වූ අතර SA- 52 භාණ්ඩාගාර ආකෘතියෙහි මුදලින් ලැබීම් වටිනාකම රු. 18,672,188 ක් විය. එම නිසා මුදලින් අත්තිකාරම් ලැබීම ආකෘති දෙක අතර රු. 18,632,388 ක විචලතාවයක් පවතින බව නිරීක්ෂණය විය.තවද මූල්‍ය ප්‍රකාශනයේ ACA – 5 ආකෘතියෙහි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ හරස් සටහන් මගින් බැර වීම රු. 20,688,652 ක් වූ අතර SA - 52 භාණ්ඩාගාර ආකෘතියෙහි හරස් සටහන් මගින් බැර වීම රු. 2,056,264 ක් වීමෙන් රු. 18,632,388 ක විචලතාවයක් නිරීක්ෂණය විය. මේ අනුව ACA-5 සහ, SA – 52 යන ආකෘති අතර මුදලින් හා හරස් සටහන් මගින් ලැබීම් අතර රු. 18,632,388 ක වෙනසක් නිරීක්ෂණය විය. | CIGAS වැඩසටහනේ මුදලින් සහ හරස් සටහන් වශයෙන් දැක්වෙන ආකාරයට වෙන් කර දක්වා ඇති අගයන් ACA - 5 ආකෘතියට දක්වා ඇත. මුදලින් අත්තිකාරම් ලැබීම්වල වෙනස සහ හරස් සටහන් මඟින් අත්තිකාරම් ලැබීම්වල වෙනස වන රු. 18,632,388ක වටිනාකම මුදල් තීරුවට එකතුවිය යුතු අතර හරස් සටහන් තීරුවෙන් අඩුවිය යුතුය. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් මුදලින් හා හරස් සටහන් මගින් ලැබීම් නිවැරදිව සටහන් කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ii) | මූල්‍ය ප්‍රකාශනයෙහි ACA- 5 ආකෘතියෙහි රජයේ නිලධාරින්ට අත්තිකාරම් යටතේ මුදලින් අත්තිකාරම් ගෙවීම් රු.5,450 ක් වූ අතර SA-52 භාණ්ඩාගාර ආකෘතියෙහි එම අගය රු. 2,944,250 ක් විය. තවද ACA-5 ආකෘතියෙහි රජයේ නිලධාරින්ට අත්තිකාරම් යටතේ හරස් සටහන් මගින් අත්තිකාරම් ගෙවීම් රු. 5,770,437 ක් වූ අතර SA- 52 භාණ්ඩාගාර ආකෘතියට අනුව ශේෂය රු. 2,831,637 ක් වූයෙන් රු. 2,938,800 ක වෙනසක් නිරීක්ෂණය විය. මේ අනුව ආකෘති දෙක අතර මුදලින් හා හරස් සටහන් මගින් අත්තිකාරම් ගෙවීම් අතර රු. 2,938,800 බැගින් විචලතාවයන් නිරීක්ෂණය විය. | මුදල් අත්තිකාරම් ගෙවීම්වල වෙනස සහ හරස් සටහන් මගින් අත්තිකාරම් ගෙවීම්වල වෙනස වන රු. 2,938,800ක වටිනාකම මුදල් තීරුවට එකතුවිය යුතු අතර හරස් සටහන් තීරුවෙන් අඩුවිය යුතුය.<br><br>මෙය ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව අත්තිකාරම් මුදලින් ගෙවීම් හා හරස් සටහන් මගින් ගෙවීම් නිවැරදිව සටහන් කල යුතු බව. |

**(ආ) කළ වැඩ අත්තිකාරම් ගිණුම**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී 2018 වර්ෂයේ සිට පැවත එන ණයගැතියන්ගෙන් වැඩිපුර ලැබීම් ගිණුමේ ශේෂය වූ රු. 16,891,719 කින්, 2009 වර්ෂයේ සිට පැවත එන ණයගැති ශේෂයක් වූ රු. 10,030,152 ක්, හිළව් කර තිබුණි. එසේ හිළව් කළ ශේෂය වැඩිපුර ලද ණයගැතියාට අදාළ වූ ශේෂයක් නොවූ නිසා මෙම හිලව් කිරීම කිසිදු පදනමක් නොමැතිව සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. | PIV හි සඳහන් කර ඇති වැඩපතට අදාළව ලැබූ මුදල අදාළ ණයගැති ගිණුමෙන් අඩු කළ පසු ඉතිරි වන මුදල සඳහා තවත් ණයගැති ශේෂයක් නොමැති විට මෙම ගිණුමට තාවකාලිකව ඇතුළත් කරනු ලබයි. පසුව අවශ්‍ය වූ විට මෙම ගිණුමෙන් ගිණුම්කරණ ගැලපීම් මඟින් ඉවත් කර අදාළ ණයගැති ගිණුමෙන් අඩු කිරීමට කටයුතු කරනු ලබයි. එම වැඩපත් සඳහා ණයගැති ශේෂයක් මේ වන තෙක් නොමැති නිසාත් දිගින් දිගටම ණයගැතියන්ගෙන් වැඩිපුර ලැබීමක් ලෙස ශේෂ පත්‍රයේ පෙන්වීමට සිදු වන නිසා | නිශ්චිතව හා නිවැරදිව හඳුනාගැනීමෙන් පසුව ගිණුම්කරණමය දෝෂ පමණක් ණයගැති හා ණයහිමි ශේෂ අතර හිලව් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | 2009 වර්ෂයේ ගිණුම්කරණමය වැරදි හේතුවෙන් ඇතිවී ඇති සත්‍ය ණයගැතියෙකු නොවන ශේෂයක් මගින් මෙම ගිණුම හරහා ගැලපීම සිදු කරන ලදී. | |
| (ii) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂවල එකතුව රු. 36,941,553 ක් වුවද ලියාහැරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් අනුමැතිය ලබාදුන් කමිටු වාර්තාව ප්‍රකාරව 2008 හා 2009 වර්ෂයන්හි ණයගැතියන්ගේ එකතුව රු. 4,045,992 ක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයන්ට අදාල ඉහත සඳහන් රු. 36,941,553ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි. | ලිපිගොනු පවතින ශේෂයන් සඳහා WD/04/DE/ණය කමිටුව/2021 හා 2022.03.29 දිනැති ලිපියෙන් අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සඳහා 2022.04.06 දිනැති අංක 2/2/08/08-2022 දරන ලිපියෙන් අනුමැතිය ලැබී ඇත. ලිපිගොනු නොමැති ශේෂ සඳහා 2021.03.24 දිනැති WD/04/DE/ණය කමිටුව/2021 අංක දරන ලිපිය මඟින් අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ සඳහා 2021.03.31 දිනැති අංක 2/2/08/05-2021 දරන ලිපියෙන් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙම වර්ෂ 02 හි ශේෂ සියල්ල සඳහාම අනුමැතිය ලැබී ඇත. | ලිපිගොනු නොමැති ශේෂ සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බවට 2021.03.31 දිනැති අංක 2/2/08/05 – 2021 දරන ලිපියෙන් දන්වා තිබූ බැවින් ඒ අනුව කටයුතු කළ යුතු බව. |

**(ඇ) ගබඩා අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ගබඩා අත්තිකාරම් ගිණුමෙන් කලවැඩ අත්තිකාරම් ගිණුමට නිකුත්කල ද්‍රව්‍ය වල වටිනාකම කළ වැඩ අත්තිකාරම් ගිණුමේ රු. 204,588,585 ක් ලෙස දක්වා තිබුණද ගබඩා අත්තිකාරම් ගිණුමෙහි නිකුත් කිරීම් වටිනාකම රු. 204,647,488 ක් ලෙස දක්වා තිබීමෙන් මෙම ගිණුම් දෙක අතර රු. 58,903 ක වෙනසක් නිරීක්ෂණය විය. | ගබඩා අත්තිකාරම් ගිණුමේ නිකුත් කිරීම් වටිනාකම වන රු. 204,647,488 සකස් වී ඇත්තේ මාසික නිකුත් කිරීම් වටිනාකම හා නිකුත් කිරීම් සඳහා මාරු පත්‍ර මඟින් කරන ලද ගැලපිලි වල එකතුවෙනි.<br><br>කළවැඩ අත්තිකාරම් ගිණුමේ හෙළිදරව් කිරීම් පිළිබඳ ප්‍රකාශනයේ නිකුත් කිරීම් වටිනාකම සටහන් කිරීමේදී ලිපිද්‍රව්‍ය රු. 44,838ක අගය ඇතුලත් කර නැත. තවද නිකුත් කිරීම් සඳහා ගබඩා අත්තිකාරම් ගිණුමෙහි සිදු | ගබඩා අත්තිකාරම් ගිණුම හා කළ වැඩ අත්තිකාරම් ගිණුම අතර මාරු කරනු ලබන ද්‍රව්‍යවල වටිනාකම නිවැරදිව ගිණුම් දෙක අතර ගැලපිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | කරන ලද රු. 14,065ක වටිනාකමද එම හෙලිදරව් කිරීමේ ප්‍රකාශයට ඇතුලත් වී නැත. එම අගයන් දෙකෙහි එකතුවෙන් රු. 58,903ක වෙනස සෑදී ඇත. | |
| (ii) | පිරිවැයට සියයට 10 ක අගයක් එකතු කර ගබඩා ද්‍රව්‍ය නිකුත් කළ යුතු අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ තොගයේ පිරිවැය රු.182,558,190 ක් විය යුතු වේ. නමුත් මූල්‍ය ප්‍රකාශන වලට අනුව තොග නිකුත් කිරීමේ පිරිවැය රු. 174,236,395 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ තොග නිකුත්කිරිමේ වටිනාකම රු. 8,321,795 ක් අඩුවෙන් දක්වා තිබුණු බව නිරික්ෂණය විය. | එම නිකුත් කිරීම් වටිනාකම් අතර වෙනසට 2023 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුම සකස් කිරීමේදී අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුව නිකුත් කළ තොගය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **හානි පාඩු ලේඛනය**<br>අංක PD- 9101 දරන වාහනයේ 2021.11.29 දින සිදු වී තිබුණු අනතුර පිළිබඳ තොරතුරු ඇතුළත්ව නොතිබුණි. | අංක PD 9101 වාහනයේ 2021.11.29 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් තාවකාලික තොරතුරු 2023.02.20 දිනෙන් ඉදිරිපත් කර ඇත. හානියේ වටිනාකම රු. 43,456 ක් වන අතර එම මුදල රක්ෂණයෙන් පියවා ඇත. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව යාවත්කාලීනව පවත්වා ගත යුතු බව. |
| (ii) | **පුද්ගල පඩිනඩි ලේඛනය**<br>පුද්ගල පඩිනඩි ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2022 වර්ෂය සඳහා පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණු අතර 2023 වර්ෂයේදී පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 453 ප්‍රකාරව 17 වැනි භාණ්ඩාගාර හා විගණන ආකෘති පත්‍රය පරිදි පුද්ගල පඩිනඩි ලේඛනයක් පවත්වා ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (iii) | **බැරකම් පිළිබඳ ලේඛනය**<br>බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2022 වර්ෂය සඳහා බැරකම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුන අතර 2023 වර්ෂය සඳහා බැරකම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක් පවත්වා ගත යුතු බව. |

**(ඉ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී කළ වැඩ අත්තිකාරම් ගිණුමේ ක්ෂය අරමුදලින් දරන ලද රු.1,682,924 ක් වූ වියදම්වලට අදාළ විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | මෙම ගිණුම පිළිබඳව සවිස්තරාත්මක තොරතුරක් අප සතුව පවතින ලිපිගොනු මඟින් සොයාගත නොහැකිය. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ශේෂයන් හා ගනුදෙනුවලට අදාළ විස්තරාත්මක උපලේඛන පවත්වා ගෙන යාම කළමනාකරණයේ වගකීමක් වන බව. |
| (ii) | 2021 වර්ෂයේදී කළ වැඩ අත්තිකාරම් ගිණුමට අදාළව රු. 53,161,909 ක් වටිනා ණයගැතියන් ලියාහැරීමට අදාළව කිසිඳු අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුනි. | ණයගැතියන් ගිණුම් ගැලපීම මඟින් ඉවත්කිරීම සඳහා ලද අදාළ අනුමැතියේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කර ඇත. | 2021 වර්ෂයේ ලියා හරින ලද ණයගැතියන් සඳහා අදාළ අනුමැතිය විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (iii) | 2012 සහ 2013 වර්ෂයන්හි මිලදී ගෙන තිබූ රු.16,467,739 ක් වටිනා යන්ත්‍රසූත්‍රවලට අදාලව හා රු.765,283 ක් වූ ලීබඩු උපකරණවලට අදාලව විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම යන්ත්‍ර සූත්‍ර විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | මේ සම්බන්ධ විස්තරාත්මක තොරතුරක් අප සතුව පවතින ලිපිගොනු මඟින් සොයාගත නොහැකි අතර මෙම මිලදීගත් වටිනාකම සොයා ගනු ලැබුවේ එම වර්ෂවල කළවැඩ අත්තිකාරම් අවසන් ගිණුම් මඟින් වේ. එහි විස්තරාත්මක තොරතුරු සඳහන් නොවේ. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් සඳහා අදාළ විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | මූල්‍ය ප්‍රකාශනයෙහි ACA – 6 ආකෘතිය සහ SA - 82 භාණ්ඩාගාර ආකෘතීන්හි සඳහන් රු.284,896,200 ක වටිනාකමකින් යුත් කාර්යාල උපකරණ, ලී බඩු උපකරණ, පරිගණක උපකරණ, විද්‍යුත් උපකරණ හා කාර්මික හා නිෂ්පාදන උපකරණ භෞතිකව හඳුනා ගැනීමට හැකි වන පරිදි කේත අංක යොදා නොතිබීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනයෙහි ACA – 6 ආකෘතිය සහ SA - 82 හි එකතුවක් වශයෙන් ඇතුළත් වන අතර එය සවිස්තරාත්මකව සිගාස් මූල්‍ය නොවන වත්කම් වාර්තාවෙ හි දැක්වේ. | මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේදී වෙන වෙනම හඳුනා ගත හැකි පරිදි කේත අංකයක් යොදා ගත යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බලය නොලත් කාරක පාඩු**

පහත සඳහන් කාරක පාඩු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු බව නිරීක්ෂණ විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.513 ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට කළවැඩ අත්තිකාරම් ගිණුමෙහි (31003) බලය නොලත් කාරක පාඩුව රු. 70,758,133 ක් විය.<br><br>මේ සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 30 දිනට පිළියෙල කරනු ලැබූ ලාභඅලාභ ගිණුම ප්‍රකාරව ශුද්ධ අලාභය රු. මිලියන 32ක් බවත් 2022 දෙසැම්බර් 31 දිනට අනුමාන කරන ලද අලාභය වෙනුවෙන් රු. මිලියන 150ක ප්‍රතිපාදන 310- 2-1-0-1701 වැය විෂයය වෙත සලසා දෙන මෙන් 2022 දෙසැම්බර් 16 දිනැති අංක 2C / සීමා සංශෝධන / 365/ 02/ (2022- 2025) යන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතු කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) ගේ ලිපියෙන් | අදහස් දක්වා නොතිබුණි. | මුදල් වර්ෂය අවසාන වීමට පෙර ප්‍රතිපාදන අනුමත කර කාරක පාඩු පියවා ගැනීමට කටයුතු කළ යුතුබව. |

ඉල්ලුම් කර තිබුණද 2023 මැයි 19 වන දින දක්වා කාරක පාඩු පියවා ගැනීම සඳහා එම ප්‍රතිපාදන සැලසී නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ රු. 1,191,508 ක් වටිනා බැරකම් ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ ජල, විදුලි, දුරකථන බිල්පත් ගෙවීම් අංශයට ලැබෙනුයේ 2023 වර්ෂයේ ජනවාරි මාසය තුළ බැවින් 2023 ජනවාරි දෙවෙනි සතිය තුල එම ජල, විදුලි, දුරකථන බිල්පත් වල සත්‍ය වියදම 2022.12.31 දිනට බැරකම් වාර්තාවට ඇතුලත් කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් ඊට ආසන්න ඇස්තමේන්තු අගයන් බැරකම් ප්‍රකාශයේ දක්වා ඇත. | බැරකම් ප්‍රකාශයේ වර්ෂයට අදාල සියළු බැරකම් ඇතුළත් කළ යුතු බව. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර | මෙම ආයතනයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස්කර ඇති අතර එය කාර්තුගතව සමාලෝචනය ලිඛිතව සිදුකිරීම සඳහා විගණන කළමනාකරණ කමිටු හරහා කටයුතු කරනු ලබන අතර ඒ පිළිබඳ ප්‍රගතිය විගණකාධිපති වෙත ලිඛිතව යොමු කිරීමටද කටයුතු කරනු ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුබව. |

| | | |
|---|---|---|
| ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.2 වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අය විය යුතුව ඇති ණය ශේෂය අදාළ ස්ථාන මාරු වී ගිය කාර්යාලයෙන් එක්වර අයකරගත යුතු වේ.එසේ වුවද 2016.04.11 දින කොළඹ මහ නගර සභාවට ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් වසර 05 කට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබූ රු. 138,300 ක ආපදා ණය ශේෂය, 2022 ජනවාරි මාසයේ සිට වාරික වශයෙන් අය වෙමින් පැවතුනද 2022 අගෝස්තු මාසයෙන් පසු වාරික වශයෙන් හෝ අයකර ගැනීමට නොහැකි වී තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. | මෙම නිලධාරියාගේ ණය ශේෂ එකවර ගෙවා නිරවුල් කරන ලෙස දන්වා කොළඹ මහ නගර සභාව වෙත 2023 මාර්තු 09 දිනැති අංක 2P/විවිධ ණය/2023/01/09 දරණ ලිපිය මඟින් දැනුම් දී ඇති අතර එම ණය ශේෂය අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. | ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුබව. |
| (ආ) | යම් නිලධාරියෙකු, ණය මුදලක් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ලබා ගන්නේ නම් නිලධාරියාගේ පාරිතෝෂික මුදල් වලින් හෝ එසේ නොමැති නම් නිලධාරියාගේ මාසික විශ්‍රාම වැටුපෙන් හෝ හිඟ ණය මුදල අයකරගත යුතු වුවත් 2022 දෙසැම්බර් 31 | අකාර්යක්ෂමතාවය මත අනිවාර්යයෙන් විශ්‍රාම යවා ඇති නිලධාරීන්ගේ ණය ශේෂ එම නිලධාරීන්ට වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව විශ්‍රාම පාරිතෝෂිතය මඟින් නිරවුල් කිරීමට නියමිතය. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුබව. |

| | | | |
|---|---|---|---|
| | දිනට විශ්‍රාම ගොස් මාස 03 සිට අවුරුදු 05 දක්වා කාලපරාසයන් ගතව තිබූ නිලධාරින් 13 දෙනෙකුගෙන් රු. 1,312,931 ක් අයකර ගෙන නොතිබුණි. | | |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කරන ලද නිලධාරියෙකුගෙන් අයකර ගතයුතු වූ වර්ෂ 05ක් ඉක්මවා තිබූ රු. 145,650 ක ණය මුදලක් වර්ෂය තුළදීද අයකරගෙන නොතිබුණි. | ණය ශේෂ කපාහරින ලෙස අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ලිපි ඉදිරිපත් කලද ණය ශේෂය අයකර ගැනීමට තවදුරටත් කටයුතු කරන ලෙස දන්වා ඇත. එබැවින් මෙය අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස අප ආයතනයේ නීති සහකාර වෙත දැනුවත් කර ඇත. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුබව. |
| (ඈ) | සේවය අතහැර ගිය නිලධාරීන් 11 දෙනෙකුගේ රු.573,080 ක් වූ ණය ශේෂ වර්ෂ 05ට වැඩි කාලයක සිටද නිලධාරීන් 03 දෙනෙකුගේ රු. 186,410 ක් වූ ණය ශේෂ වසර 01 සිට 05 දක්වා කාලයක සිටද අයකර ගත නොහැකිව පැවති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | වසර පහකට වැඩි පැරණි ණය ශේෂ පවතින නිලධාරීන් 11 දෙනාගෙන් දෙදෙනෙකු මේ වනවිට වාරික ගෙවමින් පවතී. ඉතිරි නිලධාරීන් 09 දෙනා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන අතර වර්ෂ 1 ත් 5ත් අතර වූ නිලධාරීන් තුන්දෙනාගෙන් එක් නිලධාරියෙකු මේ වන විට වාරික වශයෙන් ගෙවීම් සිදුකරන අතර එක් නිලධාරියෙකුගේ ලිපිනය සොයාගත නොහැක. අනෙක් නිලධාරියා විසින්ද වාරික කීපයක් ගෙවා ඇති අතර ඉතිරි මුදල කඩිනමින් ගෙවන ලෙසට දන්වා ඇත. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුබව. |

## 2.5 මූල්‍ය වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළ වැඩ අත්තිකාරම් ගිණුමෙහි 2022 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු. 536,724,700 ක් වූ අතර වර්ෂ 01 ත් 10ත් අතර නිරවුල් නොවූ ණයගැති ශේෂය රු. 310,357,322 ක් වූ බැවින් ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීම ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. | මෙම ණයගැති ශේෂය හඳුනාගෙන කටයුතු කිරීම සඳහා දැනට පවත්වාගෙන යනු ලබන ණයගැති ශේෂ සැසඳීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් පියවර ගත යුතු බව. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>(i) මු.රෙ. 571 | සෑම අර්ධ වර්ෂයක්ම අවසානයේදීම කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳව ලැයිස්තුවක් පිළියෙළ කර නොතිබුණි. | විගණනයේ උපදෙස් පරිදි ඉදිරියේදී කල් ඉකුත් වූ තැන්පතු ලැයිස්තුවක් අර්ධ වාර්ෂිකව පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බවට කළමනාකරණය විසින් තහවුරු කර ගත යුතු බව. |
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ<br><br>2.1 , 2.2, 2.3, 2.4, 2.5 ඡේද | 2020 ජනවාරි 31 දිනට පෙර ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචි වීම ඇතුලු කාර්යයන් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉලෙක්ට්‍රොනික රාජ්‍ය ප්‍රසම්පාදනය හා සම්බන්ධ ලේකම් කාර්යාලය මඟින් ලබාදුන් පුහුණුවට සමගාමීව ඉදිරි කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව ඉලෙක්ට්‍රොනික් ප්‍රසම්පාදන පද්ධතියට සම්බන්ධව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 ඔක්තෝබර් 02 දිනැති හා අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය<br>03 වන ඡේදය | අළුත්වැඩියා කළ වාහන පිළිබඳ තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා 2021 ජනවාරි 15 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අලුත්වැඩියා කිරීම ඵලදායී වන වාහන අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලීම සඳහා වන ආකෘතිය සකසා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කර ඇති අතර එය අමාත්‍යාංශය විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අලුත්වැඩියා කරන ලද වාහන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව. |
| (ඈ) | අංක 01/2017 දරන 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ<br>5 වන ඡේදය | 2022 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු රු. 72,379,000 ක් වූ වාහන හා රු.278,543,676 ක් වූ යන්ත්‍රෝපකරණ පිළිබඳව භාණ්ඩාගාර කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත වාර්තා කර නොතිබුණි. | යන්ත්‍රෝපකරණ හා නිෂ්පාදන උපකරණ මිලදී ගැනුම් පිළිබඳ වාර්තාවන් ඉදිරිපත් කිරීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙතින් විමසීමේ දී එම වාර්තා දැනට ඉදිරිපත් කිරීම අනවශ්‍ය බව දන්වා ඇති බැවින් විගණන විමසුමෙන් දක්වා ඇති වාර්තාවන් ඉදිරිපත් කර නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව අදාල වත්කම් විස්තර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු බව. |
| (ඉ) | 01/2020 දරණ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>13.2 වගන්තිය | 2020 වර්ෂයේ සිට භාවිතයට ගත නොහැකි වූ අංක 41-9170 දරන රථය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2015 අනුව මෙම වාහනය අපහරණය කිරීමට තක්සේරු මණ්ඩල පත්කර ඇති අතර මෙම කාර්යය තවදුරටත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය සඳහා හඳුනාගත් වාහන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව. |

## 2.7 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂ රු. 848,563 ක් වූ අතර එම ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ දෙකකට වැඩි කාලයක් තුළ නිරවුල් නොවූ ටෙන්ඩර් තැන්පතු ශේෂයන් සඳහා අදාළ ආයතන වෙත ලිපි යවා රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | නිරවුල් කළ හැකි තැන්පතු ශේෂයන් හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 7042729 දරන බැංකු ගිණුමට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව2022 දෙසැම්බර් 31 දිනට රු. 167,145 ක වටිනාකමැති මාස 06 ට වැඩි කල්ගතවූ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් 21ක් පැවති නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මාස 6ට වැඩි චෙක්පත් දින දීර්ඝ කර ගැනීම හෝ වහාම නිෂ්කාශනය කිරීමට කටයුතු කරන ලෙසට අදාල පාර්ශවයන්ට ලිඛිතව දැනුම් දී ඇත. ඒ අනුව මු.රෙ.396 (ඇ) ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ. | ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කිරීම අදාළ නිළධාරීන්ගේ වගකීම වන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම සංස්කෘතික අරමුදල සඳහා රු. 32,391,346 ක් වටිනා විදුලි ලාම්පු කණු 191 ක් සැපයීම සඳහා 2019 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබූ අතර 2022 | මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ගිවිසුම අත්සන් කිරීම සිදු නොකල අතර ඉතිරි කටයුතු සිදු කිරීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා නොදීම හේතුවෙන් ඇණවුම තවදුරටත් සිදු නොකරන ලදී. | විධිමත් ගිවිසුම් යටතේ ව්‍යාපෘති ආරම්භ කිරීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම කළමණාකරණයේ වගකීම වන බව. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට රු. 2,707,512 ක් වටිනා විදුලි ලාම්පු කණු 17 ක් පමණක් නිමකර තිබූ බැවින් භෞතික ප්‍රගතිය සියයට 9 ක් විය. ඉතිරි වී ඇති චීනවට්ටි පහන් කණු කොටස්, වීදුරු කේස් හා ඇලුමිනියම් කොටස් යනාදි උපාංග වැඩහල 01 සහ වැඩහල අංක 06 හි නිෂ්ක්‍රියව පවතින බවද නිරීක්ෂණය විය. | | |
| (ආ) | උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ සකස් කළ හැකි ඇඳන්(Adjustable Bed) 20ක් සෑදීමේ රු.400,000ක් වටිනා ව්‍යාපෘතිය මුළුමනින්ම ඉටු කර නොතිබුණි. | උතුරු කොළඹ ශික්ෂණ රෝහලට සකස් කළ හැකි ඇඳන් 20ක් අලුත්වැඩියා කිරීම් කටයුතු ද ආරම්භ කොට ඇති අතර හැකි ඉක්මනින් එම කටයුතු අවසන් කිරීමට සූදානම් කර ද ඇත. | ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි නිසි කාලපරිච්ඡේදයේ ආරම්භ කර නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2018 දෙසැම්බර් 31 රු.3,795,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාල ඉදිකිරීමට යෝජිත ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අළුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා | මෙම ව්‍යාපෘතියට අදාළව සැලසුම් සකස් කිරීමේදී අදාළ ස්ථානයේ භූමියේ පස් පිළිබඳ වාර්තාවල ඇති වූ ගැටළු සහගත තත්ත්වයක් හේතුවෙන් ස්ථානය කිහිප විටක් වෙනස් කිරීමට සිදුවිය. එබැවින් මහල් තුනකට සැලසුම් කර තිබූ මෙම ඉදිකිරීම තනි මහලක් දක්වා අඩුකොට ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇති අතර වැට ඉදිකිරීම ආදී සුළු ඉදිකිරීම් මේ වන විටත් සිදු කරමින් පවතී. | ව්‍යාපෘති භාරගැනීමෙන් පසු කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තවත් රු.10,710,572 ක් 2019 මාර්තු 14 දින හා රු. 7,694,000 ක් 2020 මාර්තු 06 දිනද ලෙස එකතුව රු.22,199,572ක් තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද 2022 දෙසැම්බර් 31 දිනටද ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විම මත ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඇල්ලේවැව දිය දොරටු ඉදිකර සවි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ඉලක්කගත ප්‍රතිපාදනය රු. 14,178,200 ක් වූ අතර භෞතික ප්‍රගතිය සියයට 5 ක් පමණක් විය. | 2021, 2022 වසරවල සිදුවූ අමු ද්‍රව්‍යවල අසාමාන්‍ය මිල ඉහළයාම මත ඇස්තමේන්තු යාවත්කාලීන කර වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර අනුමැතිය ලද පසුව කාර්යය ආරම්භ කිරීමට නියමිතය. | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු යාවත්කාලීන කර ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඌව කුඩා ඔය ජලාශය සඳහා දිය දොරටු සවි කිරීම සඳහා වූ රු. 12,708,000 ක් වූ ඇස්තමේන්තුගත වටිනාකමකින් යුත් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 20ක් පමණක් විය. | ඌව කුඩාඔය ජලාශයේ සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් තවමත් අවසන්ව නොමැති අතර සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් අවසන් වූ පසුව යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් ආරම්භ කිරීමට නියමිතය. | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ආරම්භකර ක්‍රියාත්මක කිරීමට හා නිසි කාර්යසාධනයක් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**3.3 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 37ක් පාවිච්චි නොකර ඌන උපයෝජිතව පැවතුණු අතර එම පරිශ්‍රයේම පිහිටි රූඩ් 01 පර්චස් 08.87ක බිම් ප්‍රමාණයක පිහිටි බැරල් මඩුවද නිශ්කාර්යව පැවතුණි. | මෙහි නිවාස බොහොමයක ජල බැසයාමේ ගැටලු, මුළුතැන්ගෙට ජලය ගලා ඒම, නාන කාමරවල ජල කාන්දු වීමේ ගැටලු හා විදුලි පරිපථවල විදුලි කාන්දු වීමේ ගැටලු ඇත.<br><br>බැරල් මඩුවට අයත් භූමිය දැනට ආරක්ෂක අංශයේ නිලධාරීන් | නිල නිවාස දේපළ පිළිසකර කර උපයෝජනය කිරීමට සහ නිශ්කාර්යව පවතින ඉඩම් භාවිතයට යොදා ගත හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | රාජකාරි මාරුවීමේ දී නවාතැන් ගැනීම සඳහා ලබාදී ඇත. | |
| (ආ) | මායිම් තාප්ප හෝ ස්ථිර වැටක් යොදා දෙපාර්තමේන්තුව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයේ කර්මාන්තශාලා සේවක නිවාස පිහිටි ඉඩමේ ඌන උපයෝජිතව පවතින ඉතිරි අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 11ක භූමි භාගය අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි. | මෙම අනවසර අත්පත්කර ගැනීම් 2001 වර්ෂය වන විටත් සිදුවී තිබු බව පැහැදිලි වන අතර, අනවසර පදිංචිකරුවන්ගේ නාම ලේඛනයක් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගෙන අවශ්‍ය නීතිමය කටයුතු සිදු කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවා ඇත. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන දෙපාර්තමේන්තුවට අයත් වත්කම් ආරක්ෂාකර ගැනීමට කටයුතු කිරීම කළමණාකරණයේ වගකීම වන බව. |
| (ඇ) | රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමද ඇතුළුව දෙපාර්තමේන්තුව සතු එකතුව අක්කර 24 රූඩ් 01 පර්චස් 1.87 ක් වූ ඉඩම් තුනක් වෙනුවෙන් ඔප්පු දෙපාර්තමේන්තුව සතුව නොතිබූ අතර මිනින්දෝරු සැලැස්ම පදනම් කරගෙන ප්‍රාදේශිය ලේකම් මඟින් අයිතිය තහවුරු කරගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මෙයට අදාළ මැනුම් නියෝග කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් මඟින් යවා ඇති අතර හෝමාගම මිනින්දෝරු කාර්යාලය මැනුම් කටයුතුද සිදුකර ඇතත් තවම ඔප්පු ලබාදී නොමැත. | දෙපාර්තමේන්තුවට අයත් නිරවුල් ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලබා ගැනීමට නොපමාව කටයුතු කල යුතු බව. |
| (ඈ) | ගබඩා අත්තිකාරම් ගිණුම් යටතේ වූ C අංශයේ ගබඩාවෙහි රු. 2,689,162 ක් වටිනා අයිතම 285 ක්, I අංශයේ ගබඩාවෙහි රු. 24,591,684 ක් වටිනා අයිතම 166 ක් සහ A අංශයේ රු. 16,964,968 ක් වටිනා අයිතම 281 ක් සැලකිය යුතු කාලයක සිට නිකුත් නොවී පැවතුණි.මේ හේතුවෙන් ගබඩා පවත්වාගෙන යාමේ පිරිවැය දැරීමටත්, ගබඩාවල ඉඩකඩ ඇහිරීමත්, තොග පරීක්ෂණය වෙනුවෙන් ශ්‍රමය හා කාලය අනවශ්‍ය ලෙස වැය | මෙම තොග අයිතම මේ වන විට යල් පැන නොමැති අතර, ආයතනයේ හදිසි අවශ්‍යතා සඳහා එම තොග අයිතම ගබඩාවේ රඳවාගෙන තිබේ. තවද 2022 වර්ෂයේ ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ පෙර වර්ෂවලට සාපේක්ෂව වැඩහල් සඳහා බඩු නිකුත් කිරීම අඩු විය. | කළමණාකරණය විසින් මෙම තොග ඵලදායී ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. |

කිරීමටත්, තොග යල් පැනීම හේතුවෙන් ඒවායේ වටිනාකම අඩුවීමත් සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (ඉ) | මෙන්දිස් වත්තේ සේවක නිවාස 03ක පිහිටි ඉඩමේ අක්කර 01 රූඩ් 03 පර්චස් 11ක ඉතිරි භූමි ප්‍රදේශය නිශ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. | මෙම නිවාස 03 අතරමැද පිහිටි හිස් භූමි ප්‍රදේශය එම නිවාස වලට පැමිණෙන වාහන හැරවීම සඳහා භාවිත කෙරේ. | වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු බව. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 97ක් වැය කර තිබුණි. ඒ අනුව ඒකපුද්ගල වියදම රු.257,030ක් වී තිබුණි. | ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ද්විතීය මට්ටමේ දීප ව්‍යාප්ත හා ඒකාබද්ධ සේවාවන්හි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලුම් කර ඇති අතර අග්‍රාමාත්‍ය සමාලෝචන කමිටුවට ඉදිරිපත් කිරිමට අත්‍යාවශ්‍ය නව බඳවා ගැනිම් හඳුනාගෙන ඇත. <br><br> තවද රජය පත්ව ඇති වර්තමාන ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගෙන ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීම් සීමා කරන ලදී. එසේම දැනට සිටින සේවකයින් විදේශ රැකියා සඳහා යොමු වීම මගින් රජයට වන වැය බර අඩු කිරීමට පියවර ගන්නා ලදී. | දෙපාර්තමේන්තුව විසින් අවශ්‍යතාවය මත පුරප්පාඩු පිරවීමට හෝ සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු බව. |

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 18 | 13 |
| තෘතියික මට්ටම | 10 | 02 | 08 |
| ද්විතියික මට්ටම | 282 | 149 | 133 |
| ප්‍රාථමික මට්ටම | 446 | 180 | 266 |
| වෙනත් | - | - | - |
| **එකතුව** | **769** | **349** | **420** |

දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 769 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 349 ක් විය. ඒ අනුව තනතුරු 420 ක පුරප්පාඩු පිරවීමට හෝ අවශ්‍යතාවයන්ට අනුව තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි